# තනතුරු - ඇබෑර්තු

## පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ පර්යේෂණ සහකාර (iii) ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීම

පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ පර්යේෂණ සහකාර (iii) තනතුරු එකක් (1) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත 2011.10.21 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "සභානායක ලේකම්, සභානායක කාර්යාලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "පර්යේෂණ සහකාර III ශ්‍රේණිය තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. මෙම නිවේදනයේ මූලික සුදුසුකම් ලැබූ අය පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

01. *වැටුප් පරිමාණය* : මාසිකව රු. 15,215, - 10 x 215 - 4 x 240 - 7 x 320 - 15 x 360 - 25,965 වේ.

02. *අධ්‍යාපන සුදුසුකම්* :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

03. *වයස* :
2011.10.21 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු ය.

04. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් ඉහළම ලකුණු ලබා ගන්නා තැනැත්තා තනතුර සඳහා තෝරා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙන ආකාරය පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| (i) | අධ්‍යාපන සුදුසුකම් සඳහා | ලකුණු 15 |
| (ii) | තනතුරට අදාලව ලබා ඇති වෘත්තීය සුදුසුකම් සඳහා | ලකුණු 15 |
| (iii) | භාෂා ප්‍රාගුණ්‍ය සඳහා | ලකුණු 15 |
| (iv) | පරිඝණක දැනුම සඳහා | ලකුණු 20 |
| (v) | තනතුරට අදාල කෂේත්‍රය තුළ ලබා ඇති පුහුණුව හා පළපුරුද්ද සඳහා | ලකුණු 30 |
| (vi) | නායකත්වය, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා | ලකුණු 05 |
| | | ලකුණු 100 |

05. *සේවා කොන්දේසි* :

* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

* මෙම පත්වීම මූලිකව තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව සිදු කරනු ලැබේ.

* මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව සේවයට බැඳී වසර පහක් (05) ක් ඇතුළත දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබාගත යුතු ය.

* තෝරාගත් අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය යුතු ය.

06. *වෙනත් සුදුසුකම්* :

* ශ්‍රී ලාංකිකයකු විය යුතු ය.

* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

* තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

07. අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල පිටපත් තම අයදුම්පතට අමුණා එවිය යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය;

(*ආ*) උපාධි සහතිකය හා අනෙකුත් අධ්‍යාපන සහතික;

(*ඇ*) පළපුරුද්ද සනාථ කෙරෙන වෘත්තීය හා /හෝ පර්යේෂණ කටයුතු පිළිබඳ ලබා ඇති පුහුණුවට අදාළ සහතික;

(*ඈ*) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්.

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

_________,
පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්.

2011 සැප්තැම්බර් මස 19 වැනි දින,
සභානායක කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ආදර්ශ අයදුම් පත්‍රය

**පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය**

***පර්යේෂණ සහකාර III ශ්‍රේණිය තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

02. සම්පූර්ණ නම සිංහලෙන් :—————.

03. පුද්ගලික ලිපිනය :—————.

04. උපන් දිනය :

වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

